සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO//14/9/13/2015

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2016.06.

**දිවිනැගුම සමාජ ආරක්ෂණ චක්‍රලේඛ අංක 2016/03**

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙත.**

**සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත.**

**<u>දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල යටතේ දිවිනැගුම "සිප්දොර" ශිෂ්‍යත්ව වැඩ සටහන ක්‍රියාත්මක කිරීම- 2015/2017 හා 2016/2018</u>**

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල යටතේ ක්‍රියාත්මක කරනු ලබන "දිවිනැගුම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන""**2015/2017**" අධ්‍යයන කාලය හා **"2016/2018"**අධ්‍යයන කාලය සඳහා 2016 වසරේදී ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.තවද මෙම ශිෂ්‍යත්වය සඳහා තෝරා ගන්නා ලද සිසුන්ගේ නාම ලේඛනය නැවත සංශෝධනය නොකරන බැවින් ශිෂ්‍යත්ව සඳහා සම්මුඛ පරීක්ෂණ මඟින් නිවැරදිව සුදුසුකම් සපුරා ගන්නා ලද සිසුන් පමණක් තෝරා ගන්නා ලෙස දන්වා සිටිමි. සිසුන් තෝරා ගැනීමෙන් පසුව සංශෝධන කිරීමටඅවකාශ ලබා නොදෙන බැවින් නිවැරදිම නාම ලේඛනය මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය.මේ අනුව නිවැරදි තොරතුරු ලබා නොදුනහොත් ඔබ දිස්ත්‍රික්කයට වෙන්ව ඇති උපරිම ශිෂ්‍යත්ව සංඛ්‍යාව මේ අනුව අහිමි වීමට ඉඩ ඇති බව කාරුණිකව දන්වමි.

**02. අරමුණු :-**

සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනමගින් දිවයින පුරා විසිරී සිටිනදක්ෂතා දක්වන දිවිනැගුම සහනාධාරලාභී පවුල්වල දූ දරුවන් අතරින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් උසස් ප්‍රතිඵල ලැබූ දරුවන්ට අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) අධ්‍යාපනය හැදෑරීම පිණිස මූල්‍යාධාර සැපයේ.මෙම මාසික ශිෂ්‍යත්ව ආධාර ලබා දෙනුයේ පහත දැක්වෙන අපේක්ෂාවන් පෙරදැරි කරගෙනය.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel:011-2873802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
**011- 2887722**(Hotline)

i. දිවිනැගුම සහනාධාරලාභී පවුල්වල දක්ෂතා හා කුසලතා ඇති දූ දරුවන් මූල්‍යමය අපහසුතා නිසා උසස් අධ්‍යාපනයෙන් ඈත්වීම වළක්වා ඔවුන් ඒ සඳහා යොමු කිරීම.

ii. ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේදී 5 වසර ශිෂ්‍යත්ව වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර, විශ්ව - විද්‍යාල අධ්‍යාපනයේදී මහපොළ ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ අතර මට්ටම වන අ.පො.ස. (සා.පෙළ) සමත් වී අ.පො.ස. (උ/පෙළ) හදාරන සිසු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාත්මක නොවේ. මෙය දරුවකුගේ උසස් අධ්‍යාපනයේ ආරම්භක දොරටුව වන හෙයින් එම අවස්ථාව ගිලිහී යාමට ඉඩනොදී දරුවාගේ අනාගත අධ්‍යාපනය සුරක්ෂිත කිරීම සහ උ/පෙළ හදාරන සිසුන්ගේ අධ්‍යාපනය සඳහා උපකාර කිරීමෙන් දිළිඳු පවුල්වල දරුවන් වැඩි සංඛ්‍යාවකට උසස් අධ්‍යාපන වරම් ලබාගැනීම සඳහා ඉඩප්‍රස්ථාවන් පුළුල් කිරීම.

iii. දිවිනැගුම සහනාධාරලාභී පවුල්වල දරුවන් සඳහා යහපත් සමාජ ආර්ථික පරිසරයක් ගොඩනගා ගැනීමට උපකාර වීම තුළින් සමාජයට වැඩදායී පුරවැසියන් රටටදායාද කිරීම හා රටේ සංවර්ධනයට ඔවුන්ගේ සහභාගිත්වය වැඩි වැඩියෙන් ලබා ගැනීම.

iv. දිවිනැගුම සහනාධාරලාභී පවුල්වල දරුවන් තුළ ඉහල පෞරුෂත්ව වර්ධනයක් ඇති කර ගැනීමට උපකාරි වීම හා ඒ තුළින් එම පවුල්වල ජීවන මට්ටමේ උසස් වර්ධනයක් ඇති කිරීම.

v. දිවිනැගුම සහනාධාරලාභී පවුල්වල  දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා පුළුල් කිරීමෙන් එම පවුල් වල හැකියාවන් වර්ධනය කිරීම.

vi. දිවිනැගුමසහනාධාරලාභී පවුල්වල දරුවන්ගේ ආකල්පමය හා අධ්‍යාත්මිකවර්ධනයට පිටුවහලක් වීම.

**03. ශිෂ්‍යත්වලාභීන් තෝරාගැනීම :-**

**අවශ්‍ය සුදුසුකම්:-**

i. දිවිනැගුමසහනාධාරලබන සමාජ ආරක්ෂණ අරමුදලට දායක වූ පවුලක සාමාජිකයෙකු වීම.

ii. **2014වර්ෂයේ** අ.පො.ස.(සා.පෙළ.)විභාගයේදී හා **2015වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ.)**විභාගයේදී**අනිවාර්යයෙන්ම ගණිතය, සිංහල** විෂයයන් ඇතුලත්ව ඉහළම ප්‍රතිඵල ලබා 2015 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ.) හදාරන හා 2016වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ.) හදාරනශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වීම. (විදුහල්පතිවරයාගේ සහතිකය ලබා ගත යුතුය.)

iii. වෙනත් කිසිදු ශිෂ්‍යාධාරයක් නොලබන අයකු විම.

iv. අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවෙකු වීම

v. දිවිනැගුම සහනාධාරලාභීන් අතරින්

- සමාජය විසින් රැකබලාගත යුතු (සමෘද්ධිමත් නොවූ )
  ඉතා දිළිඳු පවුල් කෙරේ ප්‍රමුඛත්වය දියයුතු වේ.
- මව/පියා අහිමි, ආබාධිත, දිළිඳු පවුල් වල දරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය.

  **(ඇමුණුම 05 උපයෝගි කර ගන්න)**

**04** <u>ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීමේ පදනම</u>

දිවිනැගුම සහනාධාරලාභී පවුල්වල අ.පො.ස (සා.පෙළ) විභාගය විශිෂ්ඨ ලෙස සමත්ව අ.පො.ස.(උ.පෙළ) හදාරන වසර දෙක සඳහා ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව තෝරා ගැනීමේ පදනම පහත පරිදි සිදු කල යුතුය.දිවිනැගුමසහනාධාරලාභී පවුල් වලින් ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් තීරණය කර ඇති අතර එක් අධ්‍යයන කාලයක් (මාස 24 ක් ) වෙනුවෙන් ශිෂ්‍යත්ව 10,000 ක සීමාව තුල එක් එක් දිස්ත්‍රික්ක සඳහා ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව මේ සමඟඇති **ඇමුණුම මඟින් ඉදිරිපත් කෙරේ.(ඇමුණුම් අංක 01 )**

පහත නිර්ණායකයන් පදනම් කර ගනිමින් ඔබ දිස්ත්‍රික්කයට සහ ඔබගේ දිස්ත්‍රික්කයට අයත් එක් එක් ප්‍රාදේශීයලේකම් කොට්ඨාශවලට නියමිත ශිෂ්‍යත්ව සංඛ්‍යාව ගණනය කරන ලදි.

i. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දරිද්‍රතා සීමා නිර්ණායක( Poverty Head Count index % )

ii. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාවේ ප්‍රතිශතය.

iii. දිස්ත්‍රික්කයේ සමස්ථ ජන සංඛ්‍යාවෙන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහනයේ ප්‍රතිශතය.

iv.දිස්ත්‍රික්කයේ සමස්ථ දිවිනැගුම සහනාධාරලාභී සංඛ්‍යාවෙන්එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවිනැගුම සහනාධාරලාභී සංඛ්‍යාවේ ප්‍රතිශතය.

යන කරුණු පදනම් කර ගනිමින් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ට හිමිශිෂ්‍යත්ව සංඛ්‍යාව තෝරා ඇත.

<u>සටහන:-</u>

**ඉහත නිර්ණායකයන් පදනම් කර ගනිමින් එක් එක් දිස්ත්‍රික්කයන්ට හිමි ශිෂ්‍යත්ව සංඛ්‍යාව අනුව ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට හිමිවන ශිෂ්‍යත්ව සංඛ්‍යාව මේ සමඟ අමුණා ඇත.**

**05.** <u>අයදුම්පත්‍ර භාරගැනීම</u> **:-**

**(අදාල වර්ෂයට අයත් අයදුම්පත්‍රය උපයෝගි කර ගන්න)**

i. මේ සමග අමුණා ඇති අංක 02 ආකෘති පත්‍රය අනුව සකසාගත් අයදුම්පත්‍රයක් ශිෂ්‍යත්වලාභියා විසින් තමා පදිංචි ප්‍රාදේශීයලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් වෙත, ග්‍රාමනිලධාරී වසම භාර දිවිනැගුම සංවර්ධන නිලධාරී සහ දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරුගේ නිර්දේශය සහිතව **2016/07/10**දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

**06.** **<u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ ශිෂ්‍යත්වලාභී නාමලේඛනය එවීම</u>**

i. ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කළ යුතු අතර ප්‍රදේශයේ ප්‍රධාන විදුහලක විදුහල්පතිවරයෙකු අනිවාර්යයෙන් පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතුය.එමගින් ඉහළ සුදුසුකම් සහිත සිසුන් ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා තෝරා ගත යුතුය. තෝරා ගන්නා ලද ශිෂ්‍යත්වලාභීන්ගේ නාමලේඛණ( **2015/2017 හා2016/2018 අධ්‍යයන කාල අනුව වෙන වෙනම ඉදිරිපත් කල යුතුය. )**

**2016/07/25**දිනට පෙර මුලස්ථාන දිවිනැගුම කළමණාකරුගේ නිවැරදි අධීක්ෂණය යටතේප්‍රාදේශීය ලේකම්ගේනිර්දේශ සහිතව දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් දිස්ත්‍රික්කයට අදාල ශිෂ්‍යත්වලාභී නාමලේඛණ(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් නිවැරදිව සකස් කර) **2016/08/05** දිනට පෙර දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිතව ප්‍රධාන කාර්යාලයට තැපැල් මගින් එවිය යුතු අතර යුනිකෝඩ් භාවිතයෙන් පහත ලිපිනයට ඊ මේල් මාර්ගයෙන් ද ලැබීමට සැලැස්විය යුතුය.ssfsamurdhi@yahoo.com (ඇමුණුම් අංක 03 ආකෘති පත්‍රය අනුව)

ii. එම නාමලේඛණ ඉදිරිපත් කිරීමේ දීතෝරා ගත් ශිෂ්‍යත්වලාභීන්ට අමතරව සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ සියලුම සිසුන්ගේ තොරතුරු ඇතුලත් නාම ලේඛණයද ප්‍රමුඛතා ගත කර ඒ සමග එවිය යුතු ය. ( ඇමුණුම් අංක 04 )

**07.** **<u>ක්‍රියාත්මක කළ යුතු ආකාරය</u> :-**

i. ශිෂ්‍යත්ව දීමනා ලබා දීමේදී දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේශිෂ්‍යත්වලාභීන්ගේ නමින්සිසුරක ගිණුමක් ආරම්භ කර වාරික මුදල් බැංකු ගිණුම් වල තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.

ii. ශිෂ්‍යත්ව මුදල් බැංකු ගිණුමට බැරකළ වහාම ඒ බව අදාල ශිෂ්‍යත්වලාභීන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

iii. ශිෂ්‍යත්ව මුදල් බැංකු ගත කරන විටම අදාල ශිෂ්‍යත්වලාභියාගේ හිමිකම් පත්‍රයේ මුදල් ගෙවූ දිනය නිවැරදිව සටහන් කිරීමට කටයුතු කළ යුතුය.

**08.** **<u>ශිෂ්‍යත්ව දීමනා</u> :-**

i. මාසික දීමනාව රුපියල් එක් දහස්පන්සියයක් (රු:1500/=) වන අතර එය පාසල් නිවාඩු කාලයද ඇතුලත්ව ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක අ.පො.ස. (උ/පෙළ) හදාරන වසර 02 සඳහා (මාස 24 ක්) ලබාදෙනු ලැබේ. ප්‍රාදේශීය ලේකම්ට පිටපතක් සහිතවශිෂ්‍යත්ව දීමනාව ලබාගැනීම සඳහා ඉදිරිපත් කළයුතු ලේඛණ ශිෂ්‍යත්ව ප්‍රදානයේදී ශිෂ්‍යත්වලාභියා වෙත ලබා දෙනු ලැබේ. එම ලිපි ඉදිරිපත් කර ශිෂ්‍යත්ව මුදල් ලබා ගත යුතු අතර, ඉන්පසු සමාජ ආරක්ෂණ අරමුදලින් ගෙවා සෑම මසකම ප්‍රතිපූර්ණය කරගත යුතුය.

ii. **මෙම ශිෂ්‍යත්ව දීමනාව කිසිඳු හේතුවක් නිසාවත් අඩුකිරීම් නොකළ යුතු අතර ප්‍රමාද කිරීම්සිදු නොකළ යුතුය.**

**09. <u>අහෝසිවීම් :-</u>**

i.වෙනත් ශිෂ්‍යාධාරයක් ලැබීම.

ii.ශිෂ්‍යත්වලාභීන් පාසැල් අධ්‍යාපනය හැර යාම.

iii. ශිෂ්‍යත්වලාභියා පාසලට පැමිණීම, හැසිරීම හා ඉගනීම් කටයුතු අසතුටුදායක අවස්ථා වලදී

සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනේ සාර්ථකත්වය සඳහා ඔබ ඇතුලු කාර්යය මණ්ඩලය දක්වන සහයෝගය අතිශය අගය කරමි.

**චන්ද්‍රා වික්‍රමසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**
**දිවිනැගුම සංවර්ධන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**පිටපත් :-**

I.ලේකම් - සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.පි

II.සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - ඉහතඋපදෙස් අනුගමනයකරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේසිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීමසඳහා

iii. ප්‍රධාන ගණකාධිකාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරුණික දැ.ගැ.පි. සහ අ.ක.ස.

iv. සියළුම අංශ ප්‍රධානීන් - කාරුණික දැ.ගැ.පි.